
# තරු ලොවට සවාරියක්



නදෙව්නි ටමාෂා විජේසුන්දර

# තරු ලොවට සවාරියක්

නදෙව්නි ටමාෂා විජේසුන්දර

# තරු ලොවට සවාරියක්

කතෘ ප්‍රකාශනයකි

නදෙව්නි ටමාෂා විජේසුන්දර

ISBN - 978 - 624 - 208 - 562 - 3

ප්‍රකාශිත දිනය - 08.02.2025

කතෘගේ වෙනත් කෘති

- අපූරු තෑග්ග
- රජතුමාගේ උපාය
- Guzz පූසාගේ අපූරු චාරිකාව
- පූසාගේ බඩ රිදිල්ල
- එලීනා සහ රියානා
- පුංචි අපට තේරවිලි
- Liza's Dream

# පිදුම

මෙම කෘතිය ලිවීමට

මට උදව් උපකාර කළ

මාගේ ආදරණීය

අප්පච්චීට, අම්මාට, ලොකු අම්මාට,

අත්තාට, අත්තම්මාට සහ

චූටි නංගීටත්

නිරතුරුවම මා දිරිමත් කරමින්

යහමඟ පෙන්වන

ආදරණීය අමිතා ගුරුතුමිය හා

සමන්මලී ගුරුතුමියටත්

ඉතා සෙනෙහසින් හා ගෞරවයෙන් පුදමි

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# තරු ලෝවට සවාරියක්

මලිති පුංචි ගැහැණු ළමයෙක්. දවසක් ඉස්කෝලේ ඉවර වෙලා ගෙදර ආව මලිතිට හුඟක් කම්මැලි හිතුණා. ඉතින් එයා මිදුලේ අඹ ගහක් යට වාඩි වෙලා පොතක් කියවන්න පටන් ගත්තා. ඒක එයා ආසම විෂයක් වුණු තරු ගැන ලියැවුණු පොතක්. ඉතින් එයා ආසාවෙන් එක දිගටම පොත කියවන්න පටන් ගත්තා. එදා වැහිබර දවසක් නිසා අහස කළුවර වෙලා වහින්න ලංවෙලා තිබුණේ.

ඔහොම ඉන්න කොට අහසින් ලොකු එළියක් මතු වෙනවා මලිති දැක්කා.

ටික ටික ඒ එළිය මලිති දිහාවට ආවා. එක පාරටම ඒ එළිය තියෙන පැත්තෙන් කට හඬක් ඇහුණා.

“මලිති, මං ළඟට එන්න. මං ළඟට එන්න” කවුදෝ කිවුවා.

හොඳටම බයවුණු මලිති දුවන්න පටන් ගත්තා. ඒත් අර එළියත් මලිති පිටිපස්සෙන්ම ආවා. මලිතිට දැන් හොඳටම මහන්සියි. තවදුරටත් එයාට කකුල උස්සගන්නවත් බැරිව ගියා. එළිය ටික ටික මලිති ළඟටම ආවා. එළියේ සැරට මලිති ඇස් දෙක පියා ගත්තා.

"ආ මලිති කොහොමද? බය වෙන්න එපා, මං ආවේ ඔයාව අහසට එක්කරගෙන යන්න. ඔයා තරු වලට ආසයිනේ. එහේ ඔයාගේ යාළුවොත් ඉන්නවා. සෙල්ලම් කරන්න ලස්සන පිට්ටනිත් තියෙනවා". මලිති හිමිහිට ඇස් දෙක ඇරියා.

එයා ඉස්සරහ හිටියේ කවුද දන්නවද? ඒ තමයි දීප්තිමත් යෝධ තරුවක්. මලිතිට පුදුම හිතුණා.

"බොරු කියන්න එපා, අහසේ පිට්ටනි නෑ" මලිති කිවුවා.



"අනේ ඉතින් මම ඔයාව අරන් යන්නේ තරු රාජධානියටනේ. එහේ හරිම ලස්සනයි. ඔයාගේ යාළුවොත් ඉන්නවා. සුරංගනාවියොත් ඉන්නවා." තරුව කිවුවා.

මලිතිට තරු රාජධානියට යන්න ආස හිතුණා. ඒ එක්කම එයාට බයකුත් හිතුණා.

"මට එහාට යන්න ආසා වුණත් ගෙදර අය මම නැතුව කලබල වෙයිනේ. ඒ නිසා මට යන්න බෑ.

මලිති දුකින් කිවුවා.


"බය වෙන්න එපා. එහේ සතියක් ඔයාගේ ලෝකෙ පැය එකයි. ඉතින් අපිට සතියක්ම ඇති තරම් විනෝද වෙලා ඔයාගේ ලෝකෙට පැයකින් එන්න පුළුවන්" තරුව කිවුවා.

"හොඳයි එහෙනම් අපි යමුකෝ. හැබැයි පැයකින් එන්න ඕනේ" එහෙම කියන ගමන් මලිති තරුව පිටට නැග්ගා.

තරුව මලිතිව පිටේ තියාගෙන අහස කෙලවරට ගියා. අහස කෙලවරේ දීප්තිමත් එළියක් විහිදුණු යෝධ ගේට්ටුවක් තිබුණා. තරුව ළඟට ගිය ගමන් යෝධ ගේට්ටුව විවෘත වුණා. තරුව එකෙන් ඇතුළට ගියා.

"මෙන්න අපේ තරු රාජධානිය"
තරුව කිවුවා.

මලිතිට ඇස් අදහාගන්න බැරි වුණා. තරු රාජධානිය ඒ තරම්ම ලස්සනයි. ඉහලින් තරු දහස් ගණනක් සමනලයින් වගේ එහා මෙහා ගියා. බිම හදලා තිබුණේ පාට හතක් තියෙන දේදුන්නකින් . ඒ විතරක් නෙවෙයි, ඉස්කෝලෙදි කියලා දුන්න තරු රටා රාශියක් මලිතිට හැබැහින්ම දැක ගන්න පුළුවන් වුණා.



කුඩා වලහා හා මහ වලහා සෙල්ලම් කරමින් හිටියා. ඔරායන් හෙවත් දඩයක්කාරයා මහ බල්ලා හා කුඩා බල්ලා සමඟ දඩයමේ යමින් හිටියා. වෘෂභ නම් ගවයා එඬේරා සමඟ යමින් හිටියා. ඒ අතර මිථුන නම් නිවුන් සොහොයුරන් ද හත්දින්නත් තරු ලෙස හඳුන්වන සත් සහෝදරියෝ ද මලිතිත් එක්ක හිනා වෙලා  කතා කළා.

මලිතිට හරිම සතුටුයි. ඉස්කෝලේ ගිය ගමන් ගුරුතුමියට මේ ගැන කියනවා කියලා මලිති හිතා ගත්තා.

“අපි වළාකුළු උඩ නැගලා ඇවිදින්න යමු ” තරුව කිවුවා. එයාල යන පාර දෙපැත්තේ පලතුරු ගස්, මල් ගස් පිරිලා තිබුණා. හැබැයි හැම මලක් ම පළතුරක් ම පාට පාට තරු හැඩයේ ඒවා වුණා. මලිති පලතුරු ගස් වලින් පලතුරු කඩාගෙන කෑවා.

ඔහොම යනකොට එයාලට පිට්ටනයක් හම්බවුණා. තරුව කිවුවා වගේ මලිතිගේ යාළුවෝ ලස්සන සුරංගනාවියෝ එක්ක සෙල්ලම් කරමින් හිටියා. එයා යාළුවන්ට කෑ ගහලා කතා කළා. හැමෝම සතුටින් සෙල්ලම් කළා.

ඔහොම සෙල්ලම් කරමින් ඉන්න කොට ලස්සන සුරංගනාවියෙක් ආවා.

“ළමයි දැන් කෑම කන වෙලාව. හැමෝම මේ බැලුන්වල නැගල මගේ පස්සෙන් එන්න. මේ බැලූන්වල පුරවලා තියෙන්නේ වතුර. ඒ නිසා ඒවා පුපුරවා ගන්න නම් එපා” .

හැමෝම බැලුන්වල නැගලා සුරංගනාවිය පස්සෙන් ගියා. ඒත් ටික දුරක් යනකොට එතන හිටපු නරක ළමයෙක් මලිතිගේ බැලූමට කූරකින් ඇන්නා.



"ඩෝං!," ගාලා බැලුම පිපිරිලා මලිති වේගයෙන් බිමට වැටෙන්න පටන් ගත්තා.

මලිති "අයියෝ" කියලා කෑ ගැහුවා. ඒ එක්කම එයා වතුරින් නෑවුණා. මලිති එකපාරටම වට පිට බැලුවා. එයා ගෙදර මිදුලේ අඹ ගහ යට වාඩිවෙලා ඉන්න බව මලිති දැක්කා. ලොකු වැස්සක් ඇවිත් මලිති තෙමෙන්න පටන් අරන් තිබුණා. එතකොටයි මලිතිට තේරුණේ එයාට තරු ගැන ලියලා තිබුන පොත කියවන ගමන් නින්ද ගිහින් කියලා. දැක්ක හැම දේම හීනයක් කියලා එයාට තේරුණා. මලිතිට තනියම හිනා ගියා.



ඇත්තටම තරු රාජධානියට යන්න ඇත්නම් කියලා හිතන ගමන් එයා වැස්සෙන් බේරෙන්න ඉක්මනට ගෙදර ඇතුළට දුවගෙන ගියා.

නිමි

.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ  මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට  එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්